# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,065 - 2018 මාර්තු මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2018.03.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 654 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 695 |


*සැ. යු.-* ජාතික විගණන පනත් කෙටුම්පත 2018 මාර්තු මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 අප්‍රේල් මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අප්‍රේල් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා පොලීසිය

### පොලිස් කොස්තාපල් තනතුර

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ - 06 යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2018.05.31 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර, ශ්‍රී ලංකා පොලිසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

*03. වැටුප් ක්‍රමය.* - රු. 3,54,480 - 7x3,600 - 27x4,440 - රු. 4,99,560.00

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි II වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිටය.

තව ද මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබාදී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

(අ) ජීවන වියදම් දීමනාව රු. 7,800.00
(ආ) රා.ප.ච. 03/2016 අනුව තනතුරට අදාළ 40% දීමනාව රු. 5,712.00
(ඇ) දුෂ්කර දීමනාව රු. 2,000.00
(ඈ) නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා රු. 250.00
(ඉ) සංයුක්ත දීමනා රු. 10,500.00 (350/- x 30 විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා)
(ඊ) සංයුක්ත දීමනා රු. 8,400.00 (350/- x 24 විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා)

මෙම දීමනාවලට අමතරව -
(අ) නොමිලේ ගමන් පහසුකම්
(ආ) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)
(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.
(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්
(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් ද, දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම් :*

*(අ) වයස් සීමාව :*

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 - 28 ත් අතර විය යුතුය. එසේ වුවද දැනට ශ්‍රී ලංකා පොලීසියේ රාජකාරියේ නියුතු පොලිස් කොස්තාපල් රියදුරන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම් කළ හැකිය.

*(ආ) අධ්‍යාපන සුදුසුකම් -*

අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 ක් සමත් විය යුතුය. වාර දෙකක දී සාමාර්ථය ලබන අපේක්ෂකයකු ප්‍රථම වාරයේ දී විෂයයන් 05 ක් සමත් විය යුතුය. (විෂයයන් 05 ඇතුළත ගණිතය හෝ මාධ්‍ය භාෂාව යන විෂයයන් දෙකම හෝ ඉන් එකක් හෝ සමත් විය යුතුය).

***සටහන 01.*** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41, 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයක් ලෙසද අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් ලෙසද සලකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

***සටහන 02.*** අ.පො.ස. (සා.පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

***සටහන 03.*** වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා.පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයන් සමත්වීම අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත් විෂයක් ලෙස ගණනය කරනු නොලැබේ.

*(ඇ) ශාරීරික සුදුසුකම් :*

* උස අඩි 05 අඟල් 04 (අවම)
* පපුව අඟල් 30 (අවම / හුස්ම නාල්ලා)

***සටහන*** *:-* විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත්, ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මදක් අඩු වුවද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා මූලික සුදුසුකම් ලබයි.

*(ඈ) දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් :-* එක් ඇසක දෘෂ්ටිය 6/12 ට අඩු නොවිය යුතුය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේනම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතුය. යම් අයදුම්කරුවෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

*(ඉ)* අනෙකුත් සුදුසුකම්:
අයදුම්කරු අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන්ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ). අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් ශ්‍රී ලංකා පොලීසියේ සේවය කරන පොලිස් කොස්තාපල් රියදුරන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*
අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන්, පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තුදීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණය සමත් විය යුතුය.

මීටර් 1000 - මිනිත්තු 03 තත්පර 44

යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම් -

* වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතුය.
* සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය :*
අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය. වෛද්‍ය පරීක්ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්වූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය සඳහා ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණය පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරිය විසින් වෛද්‍ය පරීක්ෂණයේ වාර්තා සංඛ්‍යා 169 පෝරමය යටතේ ඉදිරිපත් කරන අතර වෛද්‍ය පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වරක් පමණි.

07. *පසුබිම් පරීක්ෂණය :*
(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහ ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේදී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කල බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :*

* රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 07/2007 අනුව 2007.07.01 දින සිට රාජ්‍ය සේවයට / පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතුය.

* 2007.07.01 වන දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

* පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

*09. පත්වීමේ කොන්දේසි :*
මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

*10. සේවා කොන්දේසි :*
*(අ)* පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

*(ආ)* බඳවා ගනු ලබන නිලධාරීන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කල යුතුය.

*(ඇ)* ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවෙනි සහ දෙවෙනි වෙළුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි පොලිස් නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතුය.

*(ඈ)* තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙක්ම ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. එම පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන්ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

*(ඉ)* පත් කර ගනු ලැබූ නිලධාරීන්ට පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුවද 1973 පෙබරවාරි මස 28 දතමින් පොලිස් ගැසට් 11 අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

*(ඊ)* අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලීසියේ සේවය කල යුතු වන අතර මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම් ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වන වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතුය.

*(උ)* ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පුහුණුව ආරම්භ කල වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා /දිවුරුම් දිය යුතුය.

*(ඌ)* ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පුහුණුව ආරම්භ කල වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතුය.

*(එ)* ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, සේවය ස්ථිර කිරීමෙන් පසුව, ශ්‍රී ලංකා පොලීසියේ අනුමත උසස් කිරීමේ පටිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම *ගැසට් පත්‍රයේ* 1 කොටස (11අ) වැනි ඡෙදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වෙනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපිලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතුය. (මුල් ලිපි ලේඛන ඉදිරිපත් නොකළ යුතුය)

*(අ)* උප්පැන්න සහතිකය
*(ආ)* චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක් (ඥාතීන් නොවන)
*(ඇ)* අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
*(ඈ)* විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික
*(ඉ)* සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික (තිබේ නම් පමණක්)
*(ඊ)* ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කල යුතුය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතුය.

*(ආ)* අයදුම්කරු විසින් අයදුම්පත අඟල් 11X8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරු වලින්ම සම්පූර්ණ කර, අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියෙකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතුය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන* :- පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.

පූජිත් ජයසුන්දර,
පොලිස්පති.

**ශ්‍රී ලංකා පොලීසිය**

***ආධුනික පොලිස් කොස්තාපල් තනතුර***

*ආදර්ශ අයදුම්පත්‍රය*

| |
|---|
| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා 2" x 2 1/2" ප්‍රමාණය |

01. *(අ)* සම්පූර්ණ නම :_________.
(පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.
*(ආ)* නම (මුලකුරු සමග) :_________.
*(ඇ)* අයදුම් කරන තනතුර :_________.

02. ජාතික හැඳුනුම්පත් අංකය :_________. (ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය)
03. පියාගේ සම්පූර්ණ නම :_________.
04. අයදුම්කරු උපන් ස්ථානය :_________.
උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :_________. පළාත :_________.
05. *(අ)* වර්තමාන ලිපිනය :_________.
*(ආ)* වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :_________.
*(ඇ)* ස්ථිර ලිපිනය :_________.
*(ඈ)* ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :_________.
*(ඉ)* ලිපි හුවමාරු කල යුතු ලිපිනය :_________.
*(ඊ)* ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :_________.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :_________.
*(උ)* දුරකතන අංකය :_________. නිවස :_________. ජංගම :_________.

06. *(අ)* ජන වර්ගය :_________.
*(ආ)* ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :_________.

*(ඇ)* ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :_________.
* අයදුම්කරු :_________.
* අයදුම්කරුගේ පියා :_________.
* අයදුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තා :_________.
* අයදුම්කරුගේ පිය පාර්ශවයේ මී මුත්තා :_________.

07. උපන් දිනය :_________. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි.)
වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
අවුරුදු :_________. මාස :_________. දින :_________.

08. උස :- අඩි :_________. අඟල් :_________. පපුව :- අඟල් :_________.
09. අධ්‍යාපන සුදුසුකම් - (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.)
10. අතිරේක සුදුසුකම් : (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)
11. විවාහක / අවිවාහක බව :_________.
12. *(අ)* දැනට කරන රැකියාව :_________.
*(ආ)* ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද? :_________.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද? :_________
14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
    *(අ)* :_________
    *(ආ)* :_________
15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලිසියේ, සේවය කර තිබේ ද? :_________
    තනතුර සහ නිල අංකය :_________
    එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න :_________

16. *(අ)* ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය:_________.
    *(ආ)* ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න:_________

17. *(අ)* ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය :_________
    *(ආ)* ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද? එසේ නම් අස්වීමේදී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :_________

18. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද? :_________
    එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඩුවම් ලැබ හෝ ඇත් ද? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :_________

19. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඩුවම් ලැබ ඇත් ද? (එසේ නම් විස්තර සඳහන් කරන්න):_________

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කරගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලිසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

_________
දිනය :_________ අයදුම්කරුගේ අත්සන.

20. ආයතන ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)
    මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................මයා .............දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

_________
ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :_________
දිනය :_________

03 - 1061/1

---

## ශ්‍රී ලංකා පොලීසිය

### පොලිස් කොස්තාපල් රියදුරු තනතුර

ශ්‍රී ලංකා පොලිසියේ ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ - 06 යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2018.05.31 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර, ශ්‍රී ලංකා පොලිසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

*03. වැටුප් ක්‍රමය :*
රු. 3,54,480 - 7x3,600 - 27x4,440 - රු. 4,99,560.00

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි II වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිටය.

තවද මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබාදී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | |
|---|---|
| *(අ)* ජීවන වියදම් දීමනාව | රු. 7,800.00 |
| *(ආ)* රා.ප.චි. 03/2016 අනුව තනතුරට අදාළ 40% දීමනාව | රු. 5,712.00 |
| *(ඇ)* දුෂ්කර දීමනාව | රු. 2,000.00 |
| *(ඈ)* නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250.00 |
| *(ඉ)* සංයුක්ත දීමනා | රු. 10,500.00 (350/- x 30 විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා) |
| *(ඊ)* සංයුක්ත දීමනා | රු. 8,400.00 (350/- x 24 විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා) |

මෙම දීමනාවලට අමතරව -

*(අ)* නොමිලේ ගමන් පහසුකම්

*(ආ)* නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටකදී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)

*(ඇ)* සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

*(ඈ)* තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හ සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්

*(ඉ)* රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

*04. අවශ්‍ය මූලික සුදුසුකම් :*

*(අ) වයස් සීමාව .-* ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 19 ත් 29 ත් අතර විය යුතුය.

*(ආ) අධ්‍යාපන සුදුසුකම් :*

අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 ක් සමත් විය යුතුය. වාර දෙකකදී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේදී විෂයයන් 05 ක් සමත් විය යුතුය (විෂයයන් 05 ඇතුළත ගණිතය හෝ මාධ්‍ය භාෂාව යන විෂයයන් දෙකම හෝ ඉන් එකක් හෝ සමත් විය යුතුය)

***සටහන 01:*** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයයක් ලෙසද අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයයක් ලෙසද සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

***සටහන 02:*** අ.පො.ස. (සා.පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

***සටහන 03:*** වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා.පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

පහත සඳහන් සුදුසුකම් සපුරනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

* රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් පූර්ණ කාලීනව වසර 03ක මෝටර් කාර්මික පාඨමාලාවක් හදාරා තිබීම හා එම ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්ද.

*(ඇ) ශාරීරික සුදුසුකම් :*

උසඃ අඩි 05 අඟල් 03 (අවම)

පපුවඃ අඟල් 30 (අවම / හුස්ම නාල්ලා)

***සටහන :*** විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවලදී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මදක් අඩු වුවද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා මූලික සුදුසුකම් ලබයි.

*(ඈ) වෘත්තීය සුදුසුකම් :*

(1) සැහැල්ලු මෝටර රථ හෝ බර වාහන පැදවීමේ ප්‍රවීණතා සහතිකය ලබා තිබීම.

(2) ඉහත බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් අවුරුදු 01 ක මෝටර් රථ පැදවීමේ පළපුරුද්දක් තිබිය යුතුය.

*සටහන :* මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ දැනීම, මෝටර් රථ අළුත්වැඩියාව පිළිබඳ පලපුරුද්ද, රිය පැදවීම දිගුකාලීන පළපුරුද්ද සඳහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

* රිය පැදවීමේ දක්ෂතාව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන ශාරීරික අවයවයන් හැසිරවීමට බාධා ඇති කරන යම්කිසි අංගවිකලත්වයකින් හෝ වෙනත් ශාරීරික ආබාධයකින් පෙලෙන කිසියම් අපේක්ෂකයකු වෙතොත් එම අපේක්ෂකයා සේවයට සුදුසු බවට වෛද්‍ය සහතිකයක් ලබා තිබුණත්, ඔහු නුසුදුස්සෙකු වනු ඇත.

* මූලික සුදුසුකම් තිබෙන අයදුම්කරුවන්ගේ වාහන පැදවීම හා නඩත්තු කිරීමේ හැකියාව පිළිබඳ පරීක්ෂා කරනු ලැබේ. එමෙන්ම මාර්ග නීති, රථ වාහන සංඥා ක්‍රම පිළිබඳ අපේක්ෂකයන් ලබා ඇති දැනුමත්, එක් එක් අපේක්ෂකයා පැදවීමට නිපුනත්වය ලබා ඇති වාහනයෙහි යාන්ත්‍රික සිද්ධාන්තයන් පිළිබඳ මූලික දැනුමත් පරීක්ෂා කරනු ලැබේ.

*(ඉ)* දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් - එක් ඇසක දෘෂ්ටිය 6/12 ට අඩු නොවිය යුතුය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේනම් එයද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතුය. යම් අයදුම්කරුවෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

*(ඊ)* අනෙකුත් සුදුසුකම් :

* අයදුම්කරු අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන්ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ).

05. බඳවා ගැනීමේ ක්‍රමය :

* අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන්, පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තුදීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණය සමත් විය යුතුය.

මීටර් 1000 - මිනිත්තු 03 තත්පර 44

* යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් වෘත්තීයමය පරීක්ෂණයට කැඳවනු ලැබේ.

06. වෘත්තීමය සුදුසුකම් :

6.1 වෘත්තීමය පරීක්ෂණය පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂකගේ අධීක්ෂණය යටතේ පොලිස් රියදුරු පාසලේ සහකාර අධ්‍යක්ෂ විසිනි.

6.2 වෘත්තීමය පරීක්ෂණය සඳහා ලකුණු 100 ක් වෙන් කර ඇත. මෙම වෘත්තීයමය පරීක්ෂණය පහත පරිදි සමන්විත වේ.

| | |
|---|---|
| *(අ)* රිය පැදවීමේ ප්‍රවීනතාවය | - ලකුණු 50 |
| *(ආ)* මාර්ග නීති උපදේශක සංග්‍රහය | - ලකුණු 25 |
| *(ඇ)* වාහන නඩත්තු කිරීම සහ සුලු අලුත්වැඩියාවන් පිළිබඳ දැනීම | - ලකුණු 25 |

6.3 වෘත්තීයමය පරීක්ෂණය රිය පැදවීමේ ප්‍රවීනත්වය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 50න් අවම වශයෙන් ලකුණු 25ක් හා මාර්ග නීති උපදේශක සංග්‍රහය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 25 න් අවම වශයෙන් ලකුණු 12.5ක් සහ වාහන නඩත්තු කිරීම හා සුලු අලුත්වැඩියාවන් සම්බන්ධ දැනුම සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5ක්ද ලබා ගෙන වෘත්තීයමය පරීක්ෂණය සඳහා වෙන් කර ඇති මුලු ලකුණු 100න් ලකුණු 50ක් අවම වශයෙන් ලබා ගෙන ඇති අයදුම්කරුවන් වෘත්තීයමය පරීක්ෂණය සමත් වූ ලෙස සලකනු ලැබේ. වෘත්තීයමය පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් වෛද්‍ය පරීක්ෂණයට කැඳවනු ලැබේ.

*සටහන :* බඳවාගනු ලබන පොලිස් කොස්තාපල් රියදුරන් ආධුනික කාලය අවසන් වීමට ප්‍රථම බර වාහන පැදවීමේ ප්‍රවීණතා සහතිකය ලබාගෙන පොලිස් විද්‍යාලය මගින් පවත්වනු ලබන බර වාහන පැදවීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

07. වෛද්‍ය පරීක්ෂණය :

අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය. වෛද්‍ය පරීක්ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්වූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය සඳහා ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණය පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරිය විසින් වෛද්‍ය පරීක්ෂණයේ වාර්තා සෞඛ්‍ය 169 පෝරමය යටතේ ඉදිරිපත් කරන අතර වෛද්‍ය පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වරක් පමණි.

08. පසුබිම් පරීක්ෂණය :

*අ)* අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කල බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

09. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :*
* රාජ්‍ය පරිපාලන හ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 07/2007 අනුව 2007.07.01 දින සිට රාජ්‍ය සේවයට / පළාත් රාජය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැදී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.

* 2007.07.01 දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතියික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

* පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්/නිලධාරිනියන්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

10. *පත්වීමේ කොන්දේසි :*
මෙම පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

11. *සේවා කොන්දේසි :*
*(අ)* පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.
*(ආ)* බඳවා ගනු ලබන නිළධාරීන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූළව කටයුතු කල යුතු ය.
*(ඇ)* ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවෙනි සහ දෙවෙනි වෙළුමේ අඩංගු නියෝගයන්ට මුදල් රෙගුලාසි, පොලිස් නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

*(ඈ)* තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිළධාරියෙක්ම ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

*(ඉ)* පත් කර ගනු ලැබූ නිළධාරීන්ට පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* 11 අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍ර ලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍ර ලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතුන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

*(ඊ)* අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කල යුතු අතර, මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම් ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වන වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

*(උ)* ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන්, පුහුණුව ආරම්භ කල වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා /දිවුරුම් දිය යුතු ය.

*(ඌ)* ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන්, පුහුණුව ආරම්භ කල වහාම පොලිස්පති චක්‍ර ලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

*(එ)* ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන්, සේවය ස්ථිර කිරීමෙන් පසුව, ශ්‍රී ලංකා පොලීසියේ අනුමත උසස් කිරීමේ පටිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

12. *(අ)* මෙම *ගැසට් පත්‍රයේ* 1 කොටස (11අ) වැනි ඡෙදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

*(ආ)* 1990.03.10 වෙනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

13. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපිලේඛනවල පිටපත් ස්වකීය අයදුම් පත්‍රවලට අමුණා එවිය යුතුය. (මුල් ලිපි ලේඛන ඉදිරිපත් නොකළ යුතු ය)

(අ) උප්පැන්න සහතිකය
(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක් (ඥාතීන් නොවන)
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික
(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික (තිබේ නම් පමණක්)
(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්
(උ) රියදුරු බලපත්‍රයෙන් ඡායා පිටපතක්

14. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතු ය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත් අඟල් 11x8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර, අදළ සහතික පිටපත් සමඟ ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර, කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියෙකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

15. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.* - පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.

පූජිත් ජයසුන්දර,
පොලිස්පති.

**ශ්‍රී ලංකා පොලීසිය**
*ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර*
*ආදර්ශ අයදුම්පත්‍රය*

01. (අ) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතු ය :__________.
(ආ) නම (මුලකුරු සමග) :__________.
(ඇ) අයදුම්කරන තනතුර :__________.

02. ජාතික හැඳුනුම්පත් අංකය :__________. (ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය)
03. පියාගේ සම්පූර්ණ නම :__________.
04. අයදුම්කරු උපන් ස්ථානය :__________.
උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :__________. පළාත :__________.
05. (අ) වර්තමාන ලිපිනය :__________.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :__________.
(ඇ) ස්ථිර ලිපිනය :__________.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :__________.
(ඉ) ලිපි හුවමාරු කළ යුතු ලිපිනය :__________.
(ඊ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :__________.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :__________.
(උ) දුරකතන අංකය : නිවස :__________. ජංගම :__________.

06. (අ) ජන වර්ගය :__________.
(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද? නැතහොත් ලියා පදිංචි කිරීමෙන් ද (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න)

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :__________.
අයදුම්කරු :__________.
අයදුම්කරුගේ පියා :__________.

අයදුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තා :_________.
අයදුම්කරුගේ පිය පාර්ශවයේ මී මුත්තා :_________.

07. උපන් දිනය :_________. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි.)
වයස - (ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
අවුරුදු:_________. මාස:_________. දින:_________.

08. උස :- අඩි:_________. අඟල්:_________. පපුව :- අඟල්:_________.
09. අධ්‍යාපන සුදුසුකම් (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :_________.
10. (අ) රියදුරු බලපත්‍ර අංකය :_________.
(ආ) රියදුරු බලපත්‍රය ලබාගත් දිනය :_________.
(ඇ) ප්‍රවීණතාවය ලබා ඇති වාහන පංතිය :_________. (රියදුරු බලපත්‍රයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය)
11. අතිරේක සුදුසුකම් :_________. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)
12. විවාහක / අවිවාහක බව :_________.
13. *(අ)* දැනට කරන රැකියාව :_________.
*(ආ)* ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද? :_________.
14. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද? :_________.
15. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඃ
(අ) :_________.
(ආ) :_________.
16. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලීසියේ, සේවය කර තිබේ ද? :_________.
තනතුර සහ නිල අංකය :_________.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න :_________.

17. *(අ)* ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය:_________.
*(ආ)* ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න:_________.

18. *(අ)* ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය :_________.
*(ආ)* ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද? එසේ නම් අස්වීමේදී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න:_________.

19. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද? :_________.
එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :_________.

20. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද? (එසේ නම් විස්තර සඳහන් කරන්න):_________.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

දිනය :_________.

_________.
අයදුම්කරුගේ අත්සන.

21. ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ (අදාළ නම් පමණි)
මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................මයා .........................දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත්, ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

_________.
ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :_________.
දිනය :_________.

03 - 1061/2

## ශ්‍රී ලංකා පොලීසිය

### කාන්තා පොලිස් කොස්තාපල් තනතුර

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් "අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ - 06" යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2018.05.31 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර, ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

*03. වැටුප් ක්‍රමය :*

රු. 3,54,480 - 7x3,600 - 27x4,440 = රු. 4,99,560.00

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි II වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 වැනි දින සිටය.

තව ද, මෙම නිලධාරිනියන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබාදී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

*(අ)* ජීවන වියදම් දීමනාව රු. 7,800.00
*(ආ)* රා.ප.ච. 03/2016 අනුව තනතුරට අදාළ 40% දීමනාව රු. 5,712.00
*(ඇ)* දුෂ්කර දීමනාව රු. 2,000.00
*(ඈ)* නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා රු. 250.00
*(ඉ)* සංයුක්ත දීමනා රු. 10,500.00 (350/- x 30 විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා)
*(ඊ)* සංයුක්ත දීමනා රු. 8,400.00 (350/- x 24 විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා)

මෙම දීමනාවලට අමතරව -

*(අ)* නොමිලේ ගමන් පහසුකම්,
*(ආ)* නිලධාරිනියන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටකදී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)
*(ඇ)* සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.
*(ඈ)* තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හ සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්,
*(ඉ)* රාජකාරී සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරී සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. අවශ්‍ය මූලික සුදුසුකම් :

*(අ) වයස් සීමාව -*
*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 - 28 ත් අතර විය යුතුය.

*(ආ) අධ්‍යාපන සුදුසුකම් -*
අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 ක් සමත් විය යුතුය. වාර දෙකකදී සාමාර්ථය ලබන අපේක්ෂිකාවක් ප්‍රථම වාරයේදී විෂයන් 05 ක් සමත් විය යුතුය (විෂයන් 05 ඇතුළත ගණිතය හෝ මාධ්‍ය භාෂාව යන විෂයන් දෙකම හෝ ඉන් එකක් හෝ සමත් විය යුතුය).

*සටහන 01:* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයයක් ලෙසද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් ලෙසද සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02:* අ.පො.ස. (සා.පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03:* වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා.පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයන් සමත්වීම අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත් විෂයක් ලෙස ගණනය කරනු නොලැබේ.

*(ඇ) ශාරීරික සුදුසුකම්:*

උස අඩි 05 අඟල් 02 (අවම)

සටහන : විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවලදී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කාරියකගේ ශාරීරික සුදුසුකම් මදක් අඩු වුවද, අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා මූලික සුදුසුකම් ලබයි.

*(ඈ) දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්* - එක් ඇසක දෘෂ්ටිය 6/12 ට අඩු නොවිය යුතුය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එයද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතුය. යම් අයදුම්කාරියක් උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

*(ඉ) අනෙකුත් සුදුසුකම් :*

අයදුම්කාරිය අවිවාහක විය යුතුය. (දික්කසාද වුවත්ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ)

*05. බඳවා ගැනීමේ ක්‍රමය :*

අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කාරියන් ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කාරියන්, පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තුදීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණය සමත් විය යුතුය.

මීටර් 1000 - මිනිත්තු 05 තත්පර 14

යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කාරියන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කාරියන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතුය.

සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය කාලය පැය 01 යි.

*06. වෛද්‍ය පරීක්ෂණය :*

අයදුම්කාරියන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය. වෛද්‍ය පරීක්ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්වූ අයදුම්කාරියන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය සඳහා ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණය පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරියා විසින් වෛද්‍ය පරීක්ෂණයේ වාර්තා සෞඛ්‍ය 169 පෝරමය යටතේ ඉදිරිපත් කරන අතර, වෛද්‍ය පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වරක් පමණි.

*07. පසුබිම් පරීක්ෂණය :*

(අ) අයදුම්කාරියන්ගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහ ඇය හා ඇයගේ සමීප ඥාතීන්ගේද, ඇය ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කාරියන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේදී අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කළ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

*08. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :*

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 07/2007 අනුව 2007.07.01 දින සිට රාජ්‍ය සේවයට / පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතුය.

2007.07.01 දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධාරිනියන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතියික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්/නිලධාරිනියන්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

*09. පත්වීමේ කොන්දේසි :*

මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

*10. සේවා කොන්දේසි :*

*(අ)* පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

*(ආ)* බඳවා ගනු ලබන නිලධාරිනියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතුය.

*(ඇ)* ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවෙනි සහ දෙවෙනි වෙළුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි පොලිස් නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතුය.

*(ඈ)* තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරිනියක්ම ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණ වලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන්ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

*(ඉ)* පත් කර ගනු ලැබූ නිලධාරිනියන්ට පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුවද 1973 පෙබරවාරි මස 28 දතමින් පොලිස් ගැසට් 11 අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍ර ලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍ර ලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

*(ඊ)* අයදුම්කාරියන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලීසියේ සේවය කළ යුතු වන අතර, මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඇයගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම් ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වන වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතුය.

*(උ)* ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්වරියන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා /දිවුරුම් දිය යුතුය.

*(ඌ)* ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්වරියන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍ර ලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතුය.

*(එ)* ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්වරියන්, සේවය ස්ථිර කිරීමෙන් පසුව, ශ්‍රී ලංකා පොලීසියේ අනුමත උසස් කිරීමේ පටිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. *(අ)* මෙම *ගැසට් පත්‍රයේ* 1 කොටස (11අ) වැනි ඡෙදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

*(ආ)* 1990.03.10 වෙනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කාරියන් පහත දැක්වෙන ලිපිලේඛනවල පිටපත් ස්වකීය අයදුම් පත්‍රවලට අමුණා එවිය යුතුය. (මුල් ලිපි ලේඛන ඉදිරිපත් නොකළ යුතුය)

*(අ)* උප්පැන්න සහතිකය ;

*(ආ)* චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක් (ඥාතීන් නොවන) ;

*(ඇ)* අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික ;

*(ඈ)* විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික ;

*(ඉ)* සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික (තිබේ නම් පමණක්) ;

*(ඊ)* ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කාරිය තෝරා ගන්නා ලද්දේ නම් ඇය නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතුය.

(ආ) අයදුම්කාරිය විසින් අයදුම්පත් අඟල් 11x8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරු වලින්ම සම්පූර්ණ කර, අදළ සහතික පිටපත් සමග ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියෙකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතුය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කාරියන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන* - පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.

පූජිත් ජයසුන්දර,
පොලිස්පති.

**ශ්‍රී ලංකා පොලීසිය**

***ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර***

*ආදර්ශ අයදුම්පත්‍රය*

| |
|---|
| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා 2" x 2 1/2" ප්‍රමාණය |

01. (අ) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය :_________.
(ආ) නම (මුලකුරු සමග) :_________.
(ඇ) අයදුම්කරන තනතුර :_________.

02. ජාතික හැඳුනුම්පත් අංකය :_________. (ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය)
03. පියාගේ සම්පූර්ණ නම :_________.
04. අයදුම්කාරිය උපන් ස්ථානය :_________.
උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :_________ පළාත :_________.
05. (අ) වර්තමාන ලිපිනය :_________.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :_________.
(ඇ) ස්ථිර ලිපිනය :_________.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :_________.
(ඉ) ලිපි හුවමාරු කල යුතු ලිපිනය :_________.
(ඊ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :_________.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :_________.
(උ) දුරකතන අංකය :_________ නිවස :_________ ජංගම :_________.

06. (අ) ජන වර්ගය :_________.
(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන්ද? නැතහොත් ලියාපදිංචි කිරීමෙන්ද (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න)

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :_________.
* අයදුම්කාරිය :_________.
* අයදුම්කාරියගේ පියා :_________.
* අයදුම්කාරියගේ පිය පාර්ශවයේ මුත්තා :_________.
* අයදුම්කාරියගේ පිය පාර්ශවයේ මී මුත්තා :_________.

07. උපන් දිනය :_________. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිනිය යුතුයි.)
වයස - (ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
අවුරුදු :_________ මාස :_________ දින :_________.

08. උස ඃ අඩි :_________. අඟල් :_________.
09. අධ්‍යාපන සුදුසුකම් - (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.) :_________.

10. අතිරේක සුදුසුකම් - (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය) :_________.
11. විවාහක / අවිවාහක බව :_________.
12. (අ) දැනට කරන රැකියාව :_________.
    (ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකාවක් ද? :_________.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද? :_________.

14. අයදුම්කාරිය ගැන විමසුම් කළ හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්
    (අ) :_________.
    (ආ) :_________.

15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලීසියේ, සේවය කර තිබේ ද? :_________.
    තනතුර සහ නිල අංකය :_________.
    එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න :_________.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය:_________.
    (ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න:_________.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත්කළ යුතුය :_________.
    (ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද? එසේ නම් අස්වීමේදී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න:_________.

18. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද? :_________.
    එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :_________.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ දඬුවම් ලැබ හෝ ඇත් ද? එසේ නම් විස්තර සඳහන් කරන්න:_________.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලිසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

__________________.
අයදුම්කාරියගේ අත්සන.

දිනය :_________.

20. ආයතන ප්‍රධානියාගේ සහතිකය ෘ (අදාල නම් පමණි)
මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................මිය/මෙනවිය ...........................දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

__________________.
ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :_________.
දිනය :_________.

03 - 1061/3

---

## වෙළඳ නාවික ලේකම් කාර්යාලය

### වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ, වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | බඳවා ගන්නා ශ්‍රේණිය | තනතුර සංඛ්‍යාව |
|---|---|---|
| සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (නැව් තට්ටු) | II ශ්‍රේණිය | 01 |
| සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (ඉංජිනේරු) | II ශ්‍රේණිය | 01 |

1. සුදුසුකම් හා පළපුරුද්ද :

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* | *පළපුරුද්ද* |
|---|---|---|---|
| සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (නැව් තට්ටු) | ජලතරණ මුරකාවල කාර්යභාර නිලධාරී (සීමා රහිත) සහතිකය ලබා තිබීම | අදාළ නොවේ | දළ ටොන් 3000ට වැඩි ධාරිතාවක් ඇති සාගර තරණයෙහි යෙදෙන වෙළෙඳ නෞකාවක මුරකාවල කාර්යභාර නැව් තට්ටු නිලධාරියෙකු ලෙස වසර 02ක අවම පළපුරුද්ද |
| සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (ඉංජිනේරු) | සමුද්‍රීය ඉංජිනේරු මුරකාවල කාර්යභාර නිලධාරී (සීමා රහිත) සහතිකය | අදාළ නොවේ | කිලෝවොට් 300ට වැඩි ධාරිතාවයක් ඇති සාගර තරණයෙහි යෙදෙන වෙළෙඳ නෞකාවක මුරකාවල කාර්යභාර ඉංජිනේරු නිලධාරියෙකු ලෙස වසර 02ක අවම පළපුරුද්ද |

2. *කායික සුදුසුකම් :* සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. තෝරා ගන්නා අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

3. *වෙනත් සුදුසුකම් :* I. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට හෝ ඊට පෙර, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. එසේ මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. *වයස් සීමාව* : අවම සීමාව - අවුරුදු 21 ට නොඅඩු, උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි (දැනටමත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

5. *වැටුප් පරිමාණය.* - රු. 34,605 - 10x660 - 11x755 - 15x930 - රු. 63,460.00 (MN - 5) වන අතර, 2016.01.01 දින සිට 2020.01.01 දින දක්වා වැටුප් ගෙවීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි සඳහන් විධිවිධාන අදාළ වේ.

6. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර, පහත දක්වා ඇති ලකුණු පටිපාටියට අනුව ලකුණු ලබා දෙනු ලැබේ.

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 |
| 02. වෘත්තීය සුදුසුකම් | 25 |
| 03. අතිරේක පළපුරුද්ද<br>(බඳවා ගැනීමේදී සලකා බලනු ලබන පළපුරුද්දට අමතරව) | 20 |
| 04. ඉංග්‍රීසි භාෂා කුසලතාවය | 10 |
| 05. පරිගණක සාක්ෂරතාව | 10 |
| 06. සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වනු ලබන කුසලතාවය සඳහා | 05 |
| | 100 |

(i) මෙය ස්ථිර තනතුරකි. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

7. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

(i) මෙම *ගැසට් නිවේදනයේ* අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම්පත් ලියාපදිංචි තැපෑලෙන් 2018.05.02 දින හෝ ඊට පෙර වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්, වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය, පළමු මහල, බ්‍රිස්ටල් ගොඩනැගිල්ල, අංක 43-89, යෝක් වීදිය, කොළඹ 01, යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතු ය.

(ii) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ට අනුව, රු. 32,807.00 ක මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(iii) රාජ්‍ය සේවයේ යෙදී සිටින නිලධාරීන් සිය අයදුම්පත් අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

"වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්,
වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය,
වරාය හා නාවික අමාත්‍යාංශය,

2018 මාර්තු මස 29 වැනි දින,
පළමු මහල,
බ්‍රිස්ටල් ගොඩනැගිල්ල,
43-89, යෝක් වීදිය, කොළඹ 01.

**වරාය නාවික අමාත්‍යාංශයේ, වෙළෙඳ නාවික ලේකම් කාර්යාලයේ සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (නැව් තට්ටු)/ සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (ඉංජිනේරු) තනතුර සඳහා අයදුම්පත**

01. අයදුම්කරුගේ නම:
මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :____________.

සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :____________.

සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :____________.

02. ලිපිනය හා දුරකථන අංකය:
(i) කාර්යාලයීය ලිපිනය :____________.
දුරකථන අංකය :____________.
(ii) පෞද්ගලික ලිපිනය :____________.
දුරකථන අංකය :____________.
ජංගම දුරකථන අංකය :____________.

03. උපන් දිනය:
අවුරුද්ද :_________. මාසය :_________. දිනය :_________.

04. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස:
අවුරුද්ද :_________. මාසය :_________. දිනය :_________.

05. ජාතික හැඳුනුම්පත් අංකය :_________.
06. ස්ත්‍රී/ පුරුෂ භාවය :_________.
07. විවාහක/ අවිවාහක/වැන්දඹු ද යන වග :_________.

08. අධ්‍යාපන සුදුසුකම් හා අතිරේක අධ්‍යාපන සුදුසුකම් (සහතික කළ ඡායා පිටපත් අමුණන්න)

| සුදුසුකම් | සුදුසුකම් ලබාගත් වර්ෂය | විෂය ධාරාව | සාමාර්ථය | ආයතනයේ නම | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | | | |

09. වෘත්තීය සුදුසුකම් (සහතික කළ ඡායා පිටපත් අමුණන්න) ඃ

| සුදුසුකම් | සුදුසුකම් ලබාගත් වර්ෂය | විෂය ධාරාව | සාමාර්ථය | ආයතනයේ නම |
|---|---|---|---|---|
| | | | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තර :
(පළපුරුද්ද සනාථ කිරීම සඳහා සහතික කළ ඡායා පිටපත් අයදුම්පත සමග යොමු කළ යුතුය.)

| සේවය කළ ආයතනය | තනතුර | එම තනතුරට අදළ කාර්යයන් සැකෙවින් | සේවා කාලය |
|---|---|---|---|
| | | | |

11. ඉංග්‍රීසි හෝ දෙමළ/ සිංහල භාෂාවට ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් :______________.
12. පරිගණක සාක්ෂරතාව පිළිබඳ ලබා ඇති ප්‍රවීණතාව :
    I. උපාධිය :______________.
    II. ඩිප්ලෝමාව :______________.
    III. සහතික පත්‍ර පාඨමාලාව :______________.

13. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේ ද?

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. එසේම මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් වැරදි හෝ අසත්‍ය ඒවා බවට, බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අපේක්ෂකත්වය අවලංගු වන බවට හා බඳවා ගත් පසු අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට සිදු වන බවත් මම දනිමි.

____________________.
දිනය : ______. අයදුම්කරුගේ අත්සන.

14. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ*
මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................................... මහතා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය ..................... වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

නම : __________________.
තනතුර : __________________.
ලිපිනය : __________________.
දිනය : __________________.

15. *දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය :*
(දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා පමණක් අදාළ වේ.)

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන ..................... මයා/මිය/මෙනවිය දැනට ..................... තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ හෝ ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වන බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත් ඒ පිළිබඳ කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/ නොහැකි ය.

______________________.
දිනය:_________. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

03 - 1258

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය

වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය
**විභාග පරීක්ෂක (ඉංජිනේරු)**

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ වෙළෙඳ නාවික ලේකම් කාර්යාලයේ විභාග පරීක්ෂක (ඉංජිනේරු) තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| 01. විභාග පරීක්ෂක (ඉංජිනේරු) | 02 |

*1. බඳවාගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින්, පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (මෙම නිවේදනයේ අංක 06 යටතේ දක්වා ඇති) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

*2. අවශ්‍ය සුදුසුකම් :*

(i) අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් :

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|
| විභාග පරීක්ෂක (ඉංජිනේරු) | ශ්‍රී ලංකාව හෝ එක්සත් රාජධානිය හෝ ඕස්ට්‍රේලියාව හෝ කැනඩාව හෝ චීනය හෝ නවසීලන්තය හෝ මලයාසියාව හෝ සිංගප්පූරුව හෝ දකුණු අප්‍රිකාව හෝ අයර්ලන්තය යන රටවල හෝ අදාළ සහතික පිළිගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමග ද්විපාර්ශවික ගිවිසුම්වලට එළඹ ඇති රටක රාජ්‍ය නාවික පරිපාලන ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ ප්‍රධාන ඉංජිනේරු ප්‍රවීණතා සහතිකය ලබා තිබීම. | කිලෝවොට් 3000ට වැඩි ධාරිතාවක් ඇති ප්‍රධාන එන්ජිමක් සතු සාගර තරණයෙහි යෙදෙන වෙළෙඳ නෞකාවක ප්‍රධාන ඉංජිනේරුවකු වශයෙන් වසර 02ක අවම පළපුරුද්ද ලබා තිබීම. |

(ii) කායික සුදුසුකම් :

සැම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

(iii) *වෙනත් සුදුසුකම්:*

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- 2018.05.02 වැනි දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් 7.2.2 සිට 7.2.3 දක්වා වූ සියළුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

*03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය. ඔබ වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල ගෙවිය යුතුය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. මෙම තනතුරු සඳහා I වැනි ශ්‍රේණියට බඳවාගෙන වසර 05ක් ගතවීමට පෙර බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

(iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව තනතුරට බැදී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවක් නොවන මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ වෙළෙඳ නාවික ලේකම් කාර්යාලයේ විභාග පරීක්ෂක (ඉංජිනේරු) තනතුරට අදළ බඳවා ගැනීම් පරිපාටියට දැනටමත් කර ඇත්තාවූද, මතුවට කරනු ලබන්නාවූ ද, සංශෝධනයන්ට හා විධිවිධානයන්ට යටත් වේ.

*4. වයස් සීමාව :*

ඉල්ලුම්කරුවන් ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව බල නොපානු ඇත.

*5. වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රු. 47,615 - 10 x 1335 - 8 x 1630 - 17 x 2170 - රු. 110,895/- ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වන අතර මෙහි 20 වන පියවරෙහි (රු. 76,175/-) තබා වැටුප් ගෙවනු ලැබේ. (2016.01.01 වැනි දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි II උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිටය. (මීට අමතරව රු. 80,000/- ක වෘත්තීය දීමනාවක් සහ නිල වාහන පහසුකම් හිමිවනු ඇත.)

6. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ :

| *අනු. අංකය* | *විෂය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම්: | | 30 |
| | (අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු විද්‍යාව, වාණිජ්‍යය, කළමනාකරණය ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණය හෝ නාවික යන ක්ෂේත්‍ර වලට අදළ පශ්චාත් උපාධියක් ලබා තිබීම | 30 | |
| | *(ආ)* ඉහත ක්ෂේත්‍ර යටතේ ලබාගත් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා | 20 | |
| | *(ඇ)* ඉහත ක්ෂේත්‍ර යටතේ, | | |
| | • පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 18 | |
| | • දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 15 | |
| | • දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 12 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | | |

| අනු. අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 02 | වෘත්තීය සුදුසුකම් :<br><br>තනතුරට අදාළ ක්ෂේත්‍රයේ රජය පිළිගත් ආයතනයක,<br><br>*(අ)* වසරක ඩිප්ලෝමාවක් හදරා සම්පූර්ණ කර තිබීම සඳහා (අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබා නොදුන් සුදුසුකම් සඳහා පමණක්)<br><br>*(ආ)* මාස 06ක පාඨමාලාවක් හදරා සම්පූර්ණ කර සහතික ලබා තිබීම සඳහා (අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබා නොදුන් සුදුසුකම් සඳහා පමණක්) | 10<br><br>05 | 10 |
| 03 | අතිරේක පළපුරුද්ද :<br><br>*(අ)* බඳවා ගැනීමේ සුදුසුකම් යටතේ සඳහන් අවම පළපුරුද්ද ඉක්මවූ පළපුරුදු කාලසීමාව වෙනුවෙන්<br><br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 30ක්<br>- මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු : ලකුණු 02 | 30 | 30 |
| 04 | ක්ෂේත්‍රය සඳහා දයකත්වය :<br><br>(ප්‍රකාශන හා නව සොයාගැනීම්)<br><br>විධිමත්/පිළිගත් අනුමැතියන් හෝ සහතික ඉදිරිපත් කළ යුතුය. | 10 | 10 |
| 05 | පරිගණක හැකියාව :<br><br>*(අ)* උපාධියේ/උපාධියක ප්‍රධාන විෂයක් වශයෙන් පරිගණක/තොරතුරු තාක්ෂණය සමත්වීම<br><br>*(ආ)* රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් පරිගණක පිළිබඳ වසරක ඊට වැඩි කාලයක් සඳහා වන ඩිප්ලෝමාවක්/සහතිකයක් සඳහා (පැය 1500ක් සඳහා)<br><br>*(ඇ)* රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් පරිගණක පිළිබඳ මාස හයක (06)ක හෝ ඊට වැඩි කාලයක් සඳහා වන ඩිප්ලෝමාවක්/සහතිකයක් සඳහා (පැය 720ක් සඳහා)<br><br>*(ඈ)* රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් වෙනත් පරිගණක සඳහා වන ඩිප්ලෝමාවක්/සහතිකයක් සඳහා<br><br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ.) | 15<br><br>12<br><br>10<br><br>08 | 15 |
| 06 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | | 05 |
| | එකතුව | | 100 |

*7. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

(I.) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

(II.) සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකපත්වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(III.) සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(a) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

(b) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

*8. අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(i) අයදුම්පත් 2018.05.02 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වෙළෙඳ නාවික අධ්‍යක්ෂ ජනරාල්,
වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය,
අංක 43/89, බ්‍රිස්ටල් ගොඩනැගිල්ල,
1 වන මහළ,
යෝර්ක් වීදිය,
කොළඹ 01.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 09 දක්වාත්, දෙවැනි පිටුව 10 සිට 15 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "විභාග පරීක්ෂක (ඉංජිනේරු) තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016ට අනුව, රු. 32,807/- ක මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

09. ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එල්.පී. ජයම්පති,
ලේකම්,
වරාය හා නාවික කටයුතු අමාත්‍යංශය.

2018 මාර්තු මස 29 වැනි දින,
වරාය හා නාවික කටයුතු අමාත්‍යංශය,
අංක 19,
චෛත්‍ය පාර,
කොළඹ 01.

**ආදර්ශ අයදුම්පත්‍රය**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

***වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ විභාග පරීක්ෂක (ඉංජිනේරු) තනතුරු සඳහා අයදුම්පත***

01. අයදුම්කරුගේ නම :
  (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : ________________.
  (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
  (ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ________________.
  (iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : ________________.

02. ලිපිනය හා දුරකථන අංකය : ________________.
   (i) කාර්යාලීය ලිපිනය : ________________.
   දුරකථන අංකය : ________________.
   (ii) පෞද්ගලික ලිපිනය : ________________.
   දුරකතන අංකය : ________________.
   ජංගම දුරකතන අංකය : ________________.

03. උපන් දිනය :
   අවුරුද්ද: ________________, මාසය: ________________, දිනය : ________________.

04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
   අවුරුදු: ________________, මාස: ________________, දින: ________________.

05. ජාතික හැඳුනුම්පත් අංකය : ________________.

06. ස්ත්‍රී/පුරුෂ භාවය : ________________.

07. විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග : ________________.

08. අධ්‍යාපන සුදුසුකම් :

| *සුදුසුකම* | *සුදුසුකම් ලබාගත් වර්ෂය* | *විෂය ධාරාව* | *සාමාර්ථය* | *ආයතනයේ නම* | *වෙනත්* |
|---|---|---|---|---|---|
| | | | | | |

09. වෘත්තීය සුදුසුකම් :

| *සුදුසුකම* | *සුදුසුකම ලබාගත් වර්ෂය* | *විෂය ධාරාව* | *සාමාර්ථය* | *ආයතනයේ නම* |
|---|---|---|---|---|
| | | | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තර :

| *සේවය කළ ආයතනය* | *තනතුර* | *එම තනතුරට අදාළ කාර්යයන් සැකෙවින්* | *සේවා කාලය* |
|---|---|---|---|
| | | | |

11. ක්ෂේත්‍රය පිළිබඳ දයකත්වය : ________________.
   (ප්‍රකාශන හා නව සොයාගැනීම්)

12. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ ලබා ඇති ප්‍රවීණතාව
   (i) උපාධිය : ________________.
   (ii) ඩිප්ලෝමාව : ________________.
   (iii) සහතික පත්‍ර පාඨමාලාව : ________________.

13. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේ ද ? : ________________.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. එසේම මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් වැරදි හෝ අසත්‍ය ඒවා බවට, බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අපේක්ෂකත්වය අවලංගු වන බවට හා බඳවා ගත් පසු අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට සිදු වන බවත් මම දනිමි.

________________,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ________________.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය ........................................ වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

නම - : ________________,
තනතුර - : ________________,
ලිපිනය - : ________________,
දිනය - : ________________.

15. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය
(දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා පමණක් අදළ වේ.)

මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ සේවය කරන .................................... මයා/මිය/මෙනවිය දැනට ......... ........................................ තනතුරේ සේවය කරන බවත් ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වන බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බව හා එසේ කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගතහොත් සේවයෙන් නිදහස් කල හැකිය/නොහැකිය.

________________.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිලමුද්‍රාව.

දිනය : ________________.

03 - 1320

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

### සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි විධායක සේවා ගණයේ නීති නිලධාරී තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම - 2018

සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරී තනතුරේ පවතින පුරප්පාඩු 01 ක් පිරවීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හා ඊට පෙර "ලේකම්, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස උඩ කෙළවරේ " සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි නීති නිලධාරී තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම - 2018" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තවද විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවලට දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2018.04.30 දින වේ.

**සටහන.** - ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

*01. බඳවා ගැනීමේ ක්‍රමය:*
නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු

ලබාගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 6 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

*02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. නීති නිලධාරි 111 වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත සේවාවට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලටද මෙම පත්වීම යටත් වේ.

*03. සුදුසුකම්:*

*3.1 අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම්:*

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

*3.2 පළපුරුද්ද:*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර 03 කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛන වල පළපුරුද්ද ලබාගත් කාලය, දිනය හා නිල මුද්‍රාව පැහැදිලිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය)

*3.3 කායික සුදුසුකම්:*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

*3.4 වෙනත් සුදුසුකම්:*

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් කැඳවන අවසාන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- මනා ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවීමට හැකි වීම.

*04. වයස් සීමාව:*

ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*05. වැටුප් පරිමාණය:*

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 47,615-10 x 1335- 8 x 1630 - 17 x 2170 -රු. 110,895/- (SL-1-2016) වේ. ඔබට

වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන 11 හි සඳහන් පරිදි වේ.

*06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ:*

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :**<br>**(උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්, ඒ යටතේ අදාළ උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ.)**<br><br>*(අ)* පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය<br><br>- පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>- දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා<br>- දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා<br><br>*(ආ)* නීති විද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය<br><br>- අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>- අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා<br>- සටහන : ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණ 10 ලබාදිය යුතුයි | <br><br><br><br><br><br>20<br>15<br>10<br><br><br><br>15<br>10 | **20** |
| 02. | **අතිරේක වෘත්තීය සුදුසුකම් :**<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන නීති ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක්<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන නීති ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්<br>(එක් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවකට ලකුණු 7.5 බැගින් උපරිම ලකුණු 15)<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන නීති ක්ෂේත්‍රය පිළිබඳ මාස 06 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 15)<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන නීති ක්ෂේත්‍රය පිළිබඳ මාස 03 කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 05 බැගින් - උපරිම ලකුණු 10) | <br>15<br><br>15<br><br><br><br>15<br><br><br>10 | **15** |
| 03. | **අතිරේක පළපුරුද්ද :**<br><br>නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද - මාස 06 ට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02<br><br>එක් වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 30 ක්<br>(මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03 ක සේවා කාලය හැර)<br><br>(අවුරුදු 20 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය) | | **30** |

| | | | |
|---|---|---|---|
| 04. | **තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :** | | **15** |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදරා තිබීම සඳහා | 15 | |
| | රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා | 10 | |
| | රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 06/ පැය 720<br>- මාස 03/පැය 360 | <br>07<br>05 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ) | | |
| 05. | **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව :** | | **15** |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරන ලද පශ්චාත් උපාධිය/ උපාධිය/ පශ්චාත් නීතිවේදී උපාධිය/ නීතිවේදී උපාධිය<br>(අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය) | 15 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(වසර 01 ක් හෝ පැය 1500) | 10 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 06/ පැය 720<br>- මාස 03/පැය 360<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ) | <br><br>07<br>05 | |
| 06. | **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව :** | | **05** |
| | **මුළු එකතුව** | | **100** |

*07. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය.
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

*08. අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(i) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදසියක සකස්කර මුල් පිටුව අංක 01 සිට 06 දක්වාත් 02 වන පිටුව අංක 07 සිට 09 දක්වාත් අනෙකුත් කරුණු ඊළඟ පිටුවලට ද වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(ii) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 22,935/- ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

(iii) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(iv) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

*09. සාවද්‍ය තොරතුරු සැපයීම:*

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

11. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව සතුවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි,

ජනක සුගතදාස,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2018 ක් වූ මාර්තු මස 13 වැනි දින,
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

*සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ නීති නිලධාරී - III ශ්‍රේණියේ තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම*

පදිංචි දිස්ත්‍රික්කය : ______

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම : Mr./ Mrs./ Miss : ________________.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : Mr. /~~Mrs./ Miss~~ SILVA A.B.
1.2 සම්පූර්ණ නම : ________________.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ________________.
1.3 සම්පූර්ණ නම : ________________.
(සිංහලෙන්/ දෙමළෙන්) : ________________.

02. 2.1 ලිපිනය (පෞද්ගලික) : ________________.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ලිපිනය (පෞද්ගලික) : ________________.
(සිංහලෙන්/ දෙමළෙන්) : ________________.
2.3 ලිපිනය (රාජකාරී) : ________________.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.4 ලිපිනය (රාජකාරී) : ________________.
(සිංහලෙන්/ දෙමළෙන්) : ________________.

(රජයේ සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ/ සංස්ථාවක නිලධාරියකු ඔහුගේ රාජකාරී ලිපිනය යෙදිය යුතුය. ලිපිනයෙහි වෙනසක් වේ නම් එය වහාම දැන්විය යුතුය.)

2.5 දුරකතන අංකය (පෞද්ගලික) : ________________.
2.6 දුරකතන අංකය (කාර්යාලයීය) : ________________.
2.7 විද්‍යුත් ලිපිනය (e-mail Address) : ________________.

03. 3.1 උපන් දිනය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

වර්ෂය මාසය දිනය

3.2 අයදුම්පත භාරගන්නා අවසාන දිනට වයස -:
අවු: _______. මාස: ________. දින: ________.

04. ජාතික හැඳුනුම්පත් අංකය : ________________.

05. ස්ත්‍රී/ පුරුෂ භාවය : ________________.

06. සුදුසුකම් :
(නිවේදනයේ 03 ඡේදය යටතේ වන සුදුසුකම්)

*අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම්* : ________________
________________

*පළපුරුද්ද* : ________________
________________

*07.* *අයදුම්කරුගේ සහතිකය :*

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශකර සිටිමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයාගනු ලැබුවහොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම්, එම අයදුම්පත අවලංගු වන බව ද, තෝරා ගැනීමෙන් පසුව නම් යම්කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බවද පිළිගනිමි.

දිනය : ________________

________________ ,
අයදුම්කරුගේ අත්සන.

08. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ....................................... මයා/ මිය/ මෙනවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ ඇය මා ඉදිරිපිට දී .......................... දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

............................................ ,
සහතික කරන්නාගේ අත්සන.
(රබර් මුද්‍රාවකින් සනාථ කල යුතුය)

*සම්පූර්ණ නම* : ________________
*තනතුර* : ________________
*ලිපිනය* : ________________

09. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය (රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා පමණි.)

මෙම ඉල්ලුම්කරු වන ........................................... මයා/ මිය/ මෙනවිය, මෙම දෙපාර්තමේන්තුවේ/ පළාත් සභාවේ/ ආයතනයේ ........................... වැනි දින සිට සේවය කරයි. ඔහු/ ඇය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත/ තාවකාලික තනතුරක් දරයි. පසුගිය වසර ............. ක කාලය තුළ ඔහු/ ඇය වේතනාධික සියල්ල උපයාගෙන ඇති බවද, ඔහු/ ඇය මොනයම් හෝ විනයානුකූල දඬුවමකට

(අවවාද කිරීම් හැර) යටත් කොට නොමැති බව ද ඉහත සඳහන් කර ඇති සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/ නොහරින බව ද ............... දින ඔහු / ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මින් සහතික කරමි.

__________________
දෙපාර්තමේන්තු ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම : ________________
පදවි නාමය : ________________
දිනය : ________________
දෙපාර්තමේන්තුව/ ආයතනය : ________________
(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතු ය)

03 - 1339

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධූරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 මැයි මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 මාර්තු මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අනුරාධපුරය | හොරොව්පොතාන | උතුරු මහපොතාන කොට්ඨාසයේ උප්පැන්න මරණ හා හුරුළු පළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |
| අනුරාධපුරය | රඹෑව | රඹෑව උප්පැන්න මරණ හා නුවරගම් පළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය. |

03-1371

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය)
රෙජිස්ට්‍රාර් තනතුරු පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුමකරන්නන් විවාහක අය විය යුතු අතර, විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් බලාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 මැයි මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 මාර්තු මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | ආරච්චිකට්ටුව | පුත්තලම දිස්ත්‍රික්කයේ උඩප්පුව කොට්ඨාසයේ උප්පැන්න සහ මරණ හා උතුරු පිටිගල් කෝරළේ කොට්ඨාසයේ (සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් තනතුර | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |
| පුත්තලම | නාත්තණ්ඩිය | මුදුකටුව කොට්ඨාසයේ උප්පැන්න සහ මරණ හා දකුණු පිටිගල් කෝරළේ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුර | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |

03-1372

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු
පොලොන්නරුව දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධූරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 මැයි මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 මාර්තු මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පොලොන්නරුව | ලංකාපුර | මැද පත්තුව උතුර කොට්ඨාසයේ උප්පැන්න මරණ හා තමන්කඩුව පළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොලොන්නරුව. |

03-1373

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු
කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 මැයි මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 මාර්තු මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | උඩුබද්දාව | යගම්පත්තු කෝරළය කොට්ඨාසයේ (බිංගිරිය) අතිරේක (උඩරට/සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල. |
| කුරුණෑගල | කුලියාපිටිය බටහිර | කටුගම්පල දකුණු කෝරළය කොට්ඨාසයේ උප්පැන්න මරණ හා කටුගම්පල හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල. |
| කුරුණෑගල | කොබෙයිගනේ | බලදොර කෝරළය කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ දේවමැදි හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල. |
| කුරුණෑගල | බිංගිරිය | කිණියම කෝරළය කොට්ඨාසයේ කටුගම්පල හත්පත්තුව කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල. |
| කුරුණෑගල | රිදීගම | ඉහළ විසිදෙක නැගෙනහිර කෝරළය කොට්ඨාසයේ උප්පැන්න මරණ හා හිරියාල හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල. |
| කුරුණෑගල | මහව | කටුවන්නා කෝරළය කොට්ඨාසයේ උප්පැන්න මරණ හා වන්නි හත්පත්තුව කොට්ඨාසයේ (උඩරට/සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල. |

03-1374

---

## සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය

### සමාජ සේවා දෙපාර්තමේන්තුව

**වෘත්තීය උපදේශක - III ශ්‍රේණිය, සංඥා භාෂා පරිවර්තක - III ශ්‍රේණිය , ආධුනික භාෂා පරිවර්තක - III (කොන්ත්‍රාත්), පුනරුත්ථාපන සහායක (කොන්ත්‍රාත්), නිවාස පාලක**

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස්කරන ලද අයදුම්පත් "අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, 2 වන මහල, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල" යන ලිපිනයට 2018.05.02 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන්

එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "........................ තනතුර සඳහා බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කර තිබිය යුතුය. www.socialemwelfare.gov.lk වෙබ් අඩවිය හරහා ද ආදර්ශ අයදුම්පත හා විස්තර ලබාගත හැක.

*1. වෘත්තීය උපදේශක (තනතුරු 15)*

1.1 පුරප්පාඩු පවතින ආයතනඃ

- වෘත්තීය පුහුණු ආයතනය, සීදූව
- වෘත්තීය පුහුණු ආයතනය, කැටවල
- වෘත්තීය පුහුණු ආයතනය, වත්තේගම
- වෘත්තීය පුහුණු ආයතනය, තෙළඹියාය
- වෘත්තීය පුහුණු ආයතනය, අමුණුකුඹුර
- වෘත්තීය පුහුණු ආයතනය, කලවාන
- වෘත්තීය පුහුණු ආයතනය, මාදම්පේ
- ජයවිරු සමාධි නිවහන, පුවක්පිටිය

1.2 වෘත්තීය උපදේශක පුරප්පාඩු පවතින පාඨමාලාඃ

| *අනු. අංකය* | *පාඨමාලාව* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 01 | යන්ත්‍ර ශිල්පය | 01 |
| 02 | ගෘහස්ථ විදුලි කාර්මික | 01 |
| 03 | ඡායාරූපකරණය හා වීඩියෝකරණය | 01 |
| 04 | ඉලෙක්ට්‍රොනික් | 01 |
| 05 | හස්තකර්මාන්ත | 01 |
| 06 | සිමෙන්ති කර්මාන්ත | 01 |
| 07 | පේෂ කර්මාන්ත | 01 |
| 08 | මෝටර් කාර්මික | 01 |
| 09 | විදුලි ශිල්පය | 01 |
| 10 | වඩු කර්මාන්ත | 01 |
| 11 | කර්මාන්ත වයරින් | 01 |
| 12 | ඇළුමිනියම් පිරිසැකසුම් | 01 |
| 13 | ජංගම දුරකතන අළුත්වැඩියාව | 01 |
| 14 | උද්‍යාන අලංකරණය | 01 |
| 15 | කෘෂිකර්මය | 01 |

1.3 වයස් සීමාව ඃ
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු ඃ 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.

1.4 අධ්‍යාපන සුදුසුකම් ඃ-

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව , ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයයන් හයකින්(06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම, සහ

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂය ධාරාවකින් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීයික අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

1.5 වෘත්තීය සුදුසුකම් ඃ-

I. අදාළ වෘත්තීය පිළිබඳව ලංකා කාර්මික විද්‍යාලයෙන් හෝ ජර්මන් කාර්මික අධ්‍යාපන ආයතනයෙන් දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය, හෝ;
II. අදාළ වෘත්තිය පිළිබඳ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ හෝ පේෂකර්ම දෙපාර්තමේන්තුවේ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය, හෝ;
III. අදාළ වෘත්තිය පිළිබඳ සමාජ සේවා දෙපාර්තමේන්තුව හෝ ජාතික තරුණ සේවා සභාව හෝ ඊට අනුබද්ධ ආයතන මගින් පවත්වනු ලබන දෑ අවුරුදු හෝ ඊට වැඩි පාඨමාලා සහතික පත්‍රය, හෝ;

IV. වෘත්තීය පුහුණු අධිකාරිය හෝ ඊට අනුබද්ධ ආයතනයකින් ලබා ගත් අදාල වෘත්තීය පිළිබඳව දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය ලබා තිබීම හෝ;

V. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමට ඇතුළත් වන්නා වූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් හෝ ඒ හා සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

1.6 *බඳවා ගැනීමේ ක්‍රමය .-* ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. තෝරා ගන්නා ලද අයදුම්කරුවන් මාස 03 ක ඉගැන්වීමේ ක්‍රම පිළිබඳව පුහුණු පාඨමාලාවක් හදාරා සාර්ථකව නිම කර සහතිකයක් ලබා ගත යුතුය. එසේ සහතික ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් තනතුරට බඳවා ගනු ලැබේ.

*1.6.1 ලිඛිත පරීක්ෂණය :*

I. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01, මුළු ලකුණු 100

II. අවබෝධය - කාලය පැය 02, මුළු ලකුණු 100

*1.6.2 වෘත්තීය පරීක්ෂණය :*

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ඇත.

සුදුසුකම් ඇගයීම සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකින්ම හා වෘත්තීය පරීක්ෂණයෙන් අවම වශයෙන් ලකුණු 40 % ක් ලබා ගත යුතුය.

*1.6.3 වැටුප් පරිමාණය :*

රා.ප.ච. 03/2016 අනුව MT-01-2016

වැටුප් පරිමාණය -රු. 29840-10x300-11x350-10x560-10x660-48,890/- වේ. (මෙම වැටුප් පරිමාණය 2020.01.01 දින සිට ක්‍රියාත්මක වේ.).

2018 වසරට නියමිත වැටුපඃ මූලික වැටුප රු. 23,674/-

ගැලපුම් දීමනාව රු. 3,665/-

*1.7 සේවා කොන්දේසි :*

මෙම පත්වීම ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය. රා.ප.ච. 01/2014 හා ඊට ආනුශංගික චක්‍රලේඛ අනුව වසර 05 ක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

*2. සංඥා භාෂා පරිවර්තක (සිංහල මාධ්‍ය තනතුරු 03, දෙමළ මාධ්‍ය තනතුරු 01)*

2.1 පුරප්පාඩු පවතින ආයතන

- සමාජ සේවා දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය
- වෘත්තිය පුහුණු ආයතනය, සීදුව
- වෘත්තිය පුහුණු ආයතනය, මාදම්පේ
- වෘත්තිය පුහුණු ආයතනය, කලවාන

2.2. වයස් සීමාවඃ

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුය.

2.3 . අධ්‍යාපන සුදුසුකම්ඃ

I. අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල/ දෙමළ/ඉංග්‍රීසි භාෂාව,ගණිතය සහ තවත් විෂයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයන් හයකින් (06) සමත්ව තිබීම.

II. අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් අවම වශයෙන් එක් විෂයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය) හැර සමත්ව තිබීම.

2.4. වෘත්තීය සුදුසුකම් :

ජාතික අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන එක් අවුරුදු සංඥා භාෂා පරිවර්තක ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

2.5. *බඳවා ගැනීමේ ක්‍රමය .-* ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

ලිඛිත පරීක්ෂණය ;

I. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01, මුළු ලකුණු 100

II. භාෂා හැකියාව - කාලය පැය 01, මුළු ලකුණු 100

සුදුසුකම් ඇගයීම සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකින්ම අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතුය.

*2.6. වැටුප් පරිමාණය :*

රා.ප.ච.03/2016 අනුව MN-01-2016

වැටුප් පරිමාණය -රු. 27140-10x300-11x350-10x495-10x660- 45,540/- වේ. (මෙම වැටුප් පරිමාණය 2020.01.01 දින සිට ක්‍රියාත්මක වේ. ).

2018 වසරට නියමිත වැටුපඃ- මූලික වැටුප රු.21532/-

ගැලපුම් දීමනාව රු. 4302/-

*2.7. සේවා කොන්දේසිඃ*

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය. රා.ප.ච. 01/2014 හා ඊට ආනුශංගික චක්‍රලේඛ අනුව වසර 05 ක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

*සටහන :*

තෝරා ගත් අයදුම්කරුවන් අදාල පුරප්පාඩු සහිත ආයතනයේ වසර 5 ක් අනිවාර්යයෙන් සේවය කළ යුතුය.

3. ආධුනික භාෂා පරිවර්තක(සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ) (තනතුරු 01- කොන්ත්‍රාත්)

*3.1. වයස් සීමාවඃ-*

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 21 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය.

*3.2. අධ්‍යාපන සුදුසුකම් ඃ-*

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම

*3.3. වෘත්තීය සුදුසුකම්ඃ-*

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

*3.4. පළපුරුද්ද ඃ-*

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

*3.5. බඳවා ගැනීමේ ක්‍රමය ඃ-*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතබඳවා ගනුලැබේ.

*3.6. වැටුප ඃ-*

රු.15,215/- හා පවතින ජීවන වියදම් දීමනාව හිමිවේ (නව වැටුප් ව්‍යුහයට පසුව ගලපනු ලැබේ).

*3.7. සේවා කොන්දේසි ඃ-*

මෙම තනතුර සඳහා වසරින් වසර දීර්ඝ කිරීමේ පදනම මත, වර්ෂයක කොන්ත්‍රාත් පදනම මත පත් කෙරේ. ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි.

*සටහන :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලීම් කළ යුතුය.

*4. පුනරුත්ථාපන සහයක (තනතුරු 02 - කොන්ත්‍රාත්)*

*4.1. පුරප්පාඩු පවතින ආයතන*

- ජයවිරු සමාධි නිවහන, පුවක්පිටිය

*4.2. වයස් සීමාව ඃ-*

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.

*4.3. අධ්‍යාපන සුදුසුකම් ඃ-*

අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක් වරකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයකට නොඅඩුව සමත්වී තිබීම.

*4.4. වෘත්තීය සුදුසුකම ඃ-*

තනතුරට අදාල ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

*4.5. බඳවා ගැනීමේ ක්‍රමය :-*
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

*4.6. මාසික දීමනාව :-*
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය පරිදි දීමනාවක් ලෙස මාසිකව රු. 24240/- ක් හිමිවේ.

*4.7. සේවා කොන්දේසි :-*
මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත ඇතිකළ තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබාගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකමක් නොමැති තනතුරකි.

*5. නිවාස පාලක (තනතුරු 07)*

*5.1 වයස් සීමාව :-*
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුෑ 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුයි.

*5.2 අධ්‍යාපන සුදුසුකම් :-*

*(අ)* සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්වී තිබීම.
*(ආ)* අ.පො.ස. (උ. පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වී තිබීම.

*5.3. වෘත්තීය සුදුසුකම් :-*
රජයේ ලියාපදිංචි ආයතනයකින් ළමා සංවර්ධනය පිළිබඳ හෝ සමාජවැඩ පිළිබඳ හෝ නේවාසිකාගාර පාලනය පිළිබඳ මාස තුනකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

*5.4. බඳවාගැනීමේ ක්‍රමය :-*
ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්නපත්‍ර දෙකෙන්ම සමත්, උපරිම ලකුණු සංඛ්‍යාවක් ලබාගන්නා සුදුසුකම් ලත් අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගැනේ.

*5.4.1. ලිඛිත පරීක්ෂණය :-*

| | | |
|---|---|---|
| I. | බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01, | මුළු ලකුණු 100, |
| II. | භාෂා හැකියාව - කාලය පැය 01, | මුළු ලකුණු 100, |

*5.5. වැටුප් පරිමාණය :-*
රා.ප.ච. 03/2016 අනුව MN 01 -2016
වැටුප් පරිමාණය රු.27,140 - 10x300-11x350-10x495-10x660-රු.45,540/- වේ. (මෙම වැටුප් පරිමාණය 2020.01.01 දින සිට ක්‍රියාත්මක වේ.)

| | | | |
|---|---|---|---|
| 2018 වසරට නියමිත වැටුප :- | මූලික වැටුප | - | රු.21,532/- |
| | ගැලපුම් දීමනාව | - | රු. 4,306/- |

*5.6. සේවා කොන්දේසි :-*

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතුය. රා.ප.ච. 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව වසර පහක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

*සටහන :*
තෝරා ගන්නා අයදුම්කරුවන් පුවක්පිටිය ජයවිරු සමාධි මත්ලෝලී පුනරුත්ථාපන මධ්‍යස්ථානයට අනුයුක්ත කරන අතර ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතුය.

වජිර කඹුරුගමුව,
සමාජ සේවා අධ්‍යක්ෂ.

සමාජ සේවා දෙපාර්තමේන්තුව,
2 වන මහල,සෙත්සිරිපාය II වන අදියර,
බත්තරමුල්ල.

2018 මාර්තු මස 16 වැනි දින.

**සමාජ සේවා දෙපාර්තමේන්තුව**

*........................................................තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම්පත්‍රය*

01. මුලකුරු සමඟ නම :- ..............................................................................
02. මුලකුරු වලින් හැඳින්වෙන නම් :- ..............................................................................
03. ලිපිනය :- ..............................................................................
04. දුරකථන අංකය :- ..............................................................................
05. ජාතික හැඳුනුම්පත් අංකය :- ..............................................................................
06. උපන් දිනය :- ..............................................................................
07. අයදුම්පත් බාරගන්නා අවසන් දිනට වයස :- අවු: ................. මාස:................. දින:..........
08. විවාහක/අවිවාහක බව :- ........................................
09. ස්ත්‍රී/පුරුෂ භාවය :-.........................................
10. අධ්‍යාපන සුදුසුකම් :-

I. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ‍:
වර්ෂය :- ....................    විභාග අංකය:- ......................................

| විෂයයන් | ශ්‍රේණිය | විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

II. අ.පො.ස. (උසස් පෙළ)
වර්ෂය :- ......................................    විභාග අංකය:- ......................................

| විෂයයන් | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |

11. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :

| පාඨමාලාවේ නම | ආයතනය | පාඨමාලා කාලය |
|---|---|---|
| | | |
| | | |
| | | |

12. පළපුරුද්ද :
..............................................................................................................................................................
..............................................................................................................................................................

13. උපාධි සහතිකය පිළිබඳ විස්තර (ආධුනික භාෂා පරිවර්තක තනතුර සඳහා පමණක් අදාළ වේ.)

I. උපාධිය :-................................................................................
II. විශ්ව විද්‍යාලය/ ආයතනය :-................................................................................

III. උපාධිය වලංගු වන දිනය : ..............................................................................
IV. සාමාන්‍ය/ විශේෂ : ..............................................................................
V. විෂයය : ..............................................................................
VI. පන්තිය : ..............................................................................

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය : ________________. ________________.
අයදුම්කරුගේ අත්සන.

03 - 1479

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න හා මරණ
### රෙජිස්ට්‍රාර් තනතුරු - ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න හා මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

05. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

06. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 මැයි මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 මාර්තු මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල නගරය (බටහිර) කොට්ඨාසයේ උප්පැන්න මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |

03 - 1276

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය)
### රෙජිස්ට්‍රාර් තනතුරු - ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2018 මැයි මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 මාර්තු මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | උක්වත්ත කොට්ඨාසයේ උප්පැන්න මරණ හා ගාල්ල කඩවත් සතර කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |
| ගාල්ල | ඉමදූව | හවුපෙ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා තල්පෙ පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |
| ගාල්ල | හික්කඩුව | වේරගොඩ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා වැල්ලබඩ පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |
| ගාල්ල | නාගොඩ | උනන්විටිය කොට්ඨාසයේ උප්පැන්න මරණ හා ගඟබඩ පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |
| ගාල්ල | ගෝනාපීනුවල | කිරිදිඇල කොට්ඨාසයේ උප්පැන්න මරණ හා ගෝනාපීනුවල කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |

03 - 1293

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ඉඩම් අමාත්‍යාංශය

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2018**

බලයලත් සැලසුම් ශිල්පියෙකු ලෙස වෘත්තියේ යෙදීමට සර්වේයර් ජනරාල්ගේ සහතික පත්‍රය නිකුත් කිරීම සඳහා වන විභාගය කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය කොටස් දෙකකින් සමන්විත වේ ;

I වැනි කොටස - බණ්ඩාංක පත්‍ර පිළියෙල කිරීම
II වැනි කොටස - පිඹුරු වැඩ

2. විභාගයේ පළමුවැනි කොටස 2018 ජූලි මස 21 වැනි දින දී ද, දෙවෙනි කොටස 2018 ඔක්තෝබර් මස 13 හා 14 යන දිනයන්හි දී ද පැවැත්වෙනු ඇත. පළමු වැනි කොටසින් අසමත් වන අපේක්ෂකයින්ට දෙවෙනි කොටසට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගයේ කොටස් දෙකෙන්ම එකවර සමත්වන අපේක්ෂකයින්, බලයලත් සැලසුම් ශිල්පීන් සඳහා වන සර්වේයර් ජනරාල්ගේ සහතිකය

ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

3. විභාගයේ දී, අපේක්ෂකයින්ට පහත සඳහන් දෑ කළ හැකි බවට මා හට ඒත්තු ගැන්විය යුතුය.

(අ) ක්ෂේත්‍ර සටහනක් මගින් ඛණ්ඩාංක පත්‍රයක් නිවැරදිව පිළියෙල කිරීමට හා පරික්‍රමණයක් ඛණ්ඩාංක කිරීමට ;
(ආ) කෝණමානය භාවිතයෙන් හා ඛණ්ඩාංක ආධාරයෙන් නිවැරදිව පිඹුරක් නියැකීමට හා ක්ෂේත්‍රඵලය ගණනය කිරීමට.

4. *විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම්:*

(අ) ජාතික අධ්‍යාපන සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත් වීම ;

සහ

(ආ) රජයේ කාර්මික විද්‍යාලයක හෝ වෙනත් අර්ධ රාජ්‍ය ආයතනයක, අවුරුද්දකට නොඅඩුවූ කාල සීමාවක් සහිත, සැලසුම් ශිල්පය හා සම්බන්ධ පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

5. *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 800/- කි. මෙම මුදල සර්වේයර් ජනරාල් කාර්යාලයේ සරප් කවුන්ටරය වෙත, ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයක් වෙත හෝ දියතලාව, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය වෙත ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පත්‍රයේ ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය). විභාග ගාස්තුව මුදල් ඇණවුම් හෝ චෙක්පත් මගින් භාරගනු නොලැබේ. රිසිට්පත නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මුද්දර මගින් හෝ චෙක්පත් මගින් කරනු ලබන ගෙවීම් භාරගනු නොලැබේ.

6. *අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :*

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සෙ.මී. 21 x සෙ.මී. 29 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරන ලද අයදුම්පත්‍රයක්, පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2018" යනුවෙන් සඳහන් කරන්න.

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (විභාග),
විභාග අංශය,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ.පෙ. 506,
කොළඹ 05.

දෙන ලද ආදර්ශ අයදුම්පතට අනුකූලව පිළියෙල කර නොමැති අයදුම්පත් ද, නිසි පරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ද, ගැසට් නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු කුමන හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.

8. අයදුම්පත් 2018 මැයි මස 25 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. එදිනට පසු එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.

9. ඛණ්ඩාංක පත්‍ර හා ඇඳීම් කඩදාසි විභාග ශාලාවේදී සපයනු ලැබේ. කෙසේ වෙතත් අයදුම්කරුවන් විසින් ඇඳීම් උපකරණ ද, ඛණ්ඩාංක ගණනය කිරීමට අවශ්‍ය ගණිත වගු යනාදිය ද, අවශ්‍ය අනෙකුත් සියළු උපකරණ ද රැගෙන ආ යුතුය. විභාග ශාලාධිපතිගේ අවසරය ඇතිව මෘදුකාංග රහිත සාමාන්‍ය විද්‍යාත්මක ගණක යන්ත්‍ර භාවිතා කිරීමට ඉඩ දෙනු ලැබේ.

10. (i) සෑම විභාග අපේක්ෂකයෙකුම විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් එකක් ඉදිරිපත් කළ හැකිය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත ;

(ආ) වලංගු ගුවන් ගමන් බලපත්‍රයක් ;

(ඇ) විභාගය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයදුම්කරුගේ ඡායාරූපයක් ද සහිතව බලපත්‍රයක් හෝ අනන්‍යතා ලියවිල්ලක්.

(ii) ඉහත 10 (i) හි පරිදි තමන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

11. මෙම විභාගය මෙට්‍රික් ඒකක ක්‍රමය යටතේ පැවැත්වෙනු ඇත.

පී. එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

2018 මාර්තු මස 13 වැනි දින,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ.පෙ. 506,
කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2018**

විභාග අංකය [ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(අ) (i) මුලකුරු සමග නම : (මයා/මිය/මෙනෙවිය)
සිංහලෙන් : ________________.
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : ________________.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :
සිංහලෙන් : ________________.
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : ________________.

(ආ) ස්ත්‍රී/ පුරුෂ භාවය : ________________.
(ඇ) තනතුර : ________________.
(ඈ) රැකියා ස්ථානයේ ලිපිනය : ________________.
(ඉ) ස්ථිර ලිපිනය :
සිංහලෙන් : ________________.
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : ________________.

(ඊ) උපන් දිනය :..................................................................................
(උ) අධ්‍යාපන සුදුසුකම් (සහතික කරන ලද සත්‍ය පිටපත් අමුණා තිබිය යුතුය) : ________________.
(ඌ) විභාගයට පෙනී සිටින මාධ්‍යය : සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි
(එ) මුදල් ගෙවූ කාර්යාලය : ________________.
(ඒ) රිසිට්පත් අංකය : ________________.

දිනය : ________________.

(ලදුපත මෙහි අලවන්න)

මා විසින් ඉහතින් දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි තොරතුරු බව සහතික කරමි.

________________.
අයදුම්කරුගේ අත්සන

දිනය : ________________.

03 - 1140

## ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව)

අංක 1930/12 හා 2015.09.01 දිනැති රජයේ *අති විශේෂ ගැසට්* නිවේදනය මගින් ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුකූලව යථෝක්ත පාඨමාලාව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් 2018 ජූලි මස සිට සති අන්ත පාඨමාලාවක් ලෙස සති 15ක් පුරා සෙනසුරාදා දිනයන්හි පැවැත්වීම ආරම්භ කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම පාඨමාලාව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේදී ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, පාඨමාලාව අවසානයේදී එකිනෙක විෂයය සඳහා අවසන් පරීක්ෂණයක් පැවැත්වේ. එහි ප්‍රතිඵල මත පාඨමාලාව සමත්වීම තීරණය කරනු ලබන අතර සමත් වූ අයදුම්කරුවන් ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළා සේ සැළකේ. පාඨමාලාවට නිලධරයන් තෝරා ගැනීම, පාඨමාලාව පැවැත්වීම, විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම, පාඨමාලා සහතික නිකුත් කිරීම හා පාඨමාලාව සඳහා සහන කාල ලබාදීම සම්බන්ධයෙන් එම පීඨයේ පීඨාධිපති විසින් නියම කරන ලද නීතිරීතිවලට පාඨමාලා අපේක්ෂකයින් යටත් වේ. විශ්වවිද්‍යාලය විසින් පනවනු ලබන නීතිරීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල විසින් පනවනු ලබන දඬුවමකට හා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්වීමට ඔවුනට සිදුවෙනු ඇත.

(ii) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පනවනු ලබන නීතිරීති හා පාඨමාලාව සම්බන්ධව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පාඨමාලාව ආරම්භයේදී ඔබව දැනුවත් කරනු ඇත.

03. මෙම පාඨමාලාව සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂක/අපේක්ෂිකාවන් ස්වකීය අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතු අතර, ඒ අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ රජයේ නිලධරයෙකු නම් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකු නම් ඔවුන් සේවය කරන පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින් ද, 2018 මැයි මස 04 වැනි දින නොඉක්මවා, පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනය වෙත තම අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව) ලෙස සඳහන් විය යුතු ය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් කිසිදු පරීක්ෂණයකින් තොරව ප්‍රතික්ෂේප කිරීමට පීඨාධිපති වෙත බලය පිරිනමනු ලැබේ.

04. අනන්‍යතාවය :

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති සෑහීමකට පත් වන ලෙස තම අනන්‍යතාව අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පාඨමාලා ආරම්භයේදී හා පාඨමාලා කාලය තුළ අවශ්‍යතාවය මත ඉදිරිපත් කිරීමට අපේක්ෂකයන් විසින් ළඟ තබා ගත යුතු ය.

*(අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය.

*(ආ)* තම ආයතනය විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය ;

හෝ

තම ආයතනය විසින් නිකුත් කරන ලද අනන්‍යතාවය තහවුරු කල හැකි ලේඛනයක්

*05. අයදුම්පත්‍රය :*

(i) "ඒ 4" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය පිළියෙල කළ යුතු ය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුවද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින් පිරවිය යුතු අතර විශේෂයෙන්ම සඳහන් කර ඇති අවස්ථාවලදී පමණක් විශේෂයෙන් සඳහන් කර ඇති භාෂාවෙන් අයදුම්පත පිරවිය යුතු ය. අයදුම්පතේ සඳහන් පරිදි නිලධරයන්ගේ නම පාඨමාලාවේ සියලු අවස්ථාවලදී භාවිතා කරන බැවින් ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු ය. යම් හෙයකින් එම තොරතුරු පාඨමාලා කාලය තුළ වෙනස් වුවහොත් ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ලිඛිතව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා වෙත දැනුම් දිය යුතු ය.

(ii) ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) අයදුම්කරු විසින් අයදුම්පතේ මුල්පිටේ දකුණත් පස ඉහළ කෙළවරේ සපයා ඇති කොටුව තුළ තැපැල් මුද්දරයක ප්‍රමාණයේ ඡායා රූපයක් ඇලවිය යුතු වන අතර තවත් තැපැල් මුද්දරයක ප්‍රමාණයේ ඡායා රූපයක් අයදුම්පත සමඟ අමුණා තිබිය යුතු ය.

*06. පාඨමාලා ගාස්තු හා විභාග ගාස්තු :*

i. මෙම පාඨමාලාව සඳහා පෙනී සිටින නිලධරයන් විසින් රු. 17,500.00 ක මුදලක් මහජන බැංකුව ගංගොඩවිල ශාඛාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨ සංවර්ධන අරමුදල් ජංගම ගිණුම් අංක 097100140002229 නමට සේවා නියුක්ත ආයතනය මගින් එවනු ලබන චෙක්පතකින් හෝ බැංකු අණකරයකින්, අදාළ අයදුම්කරු විසින් මුදල් තැන්පත් කර, ලබාගත් රිසිට්පත ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨාධිපති කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා වෙත පාඨමාලා සමායෝජක විසින් දැනුම් දෙනු ලබන දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය. මෙම මුදල සඳහා ආයතනික ගාස්තු, මුද්‍රණ ගාස්තු, විභාග ගාස්තු, සම්පත්දායක දීමනා, සම්බන්ධීකරණ ගාස්තු ඇතුළත් වේ.

ii. එසේ වුවත් මුල් අවස්ථාවේදී පාඨමාලාවට අදාළ විභාග සම්පූර්ණ කිරීමට අපොහොසත් වුවහොත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විභාගයට පෙනී සිටින්නේ නම් විභාග සඳහා ලියාපදිංචි ගාස්තු ලෙස රු. 1,000.00 ක ගාස්තුවක් ද, රු. 2,000.00ක විභාග ගාස්තුවක් ද, ගෙවිය යුතු ය. එම ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපතිගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

iii. කවර හේතුවක් යටතේ වුවද මෙම පාඨමාලාව සඳහා අයකරන කිසිදු ගාස්තුවක් ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් හෝ පාඨමාලාවක් හෝ නිලධරයකු සඳහා මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

*07. පාඨමාලාව හැදෑරීමේ අවශ්‍යතාවය :*

i. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර සියලු නිලධරයන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

ii. 2013.06.01 දින වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස්වී වසර පහ (05)ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

***සටහන*** : දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඒ ඒ නිලධරයාගේ ජ්‍යෙෂ්ඨතාවය හා ඉහත 07.i, 07.ii ඡේදවල කරුණු සම්බන්ධයෙන් තම අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

*08. පාඨමාලාව සඳහා තෝරා ගැනීම :*

i. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් වූ නිලධරයන්ගේ එම ශ්‍රේණියට පත්වූ ජ්‍යෙෂ්ඨතාවය අනුපිළිවෙල අනුව පාඨමාලාව සඳහා නිලධරයන් තෝරා ගැනීමේදී ප්‍රමුඛතාවය ලබා දේ.

ii. මෙම අවස්ථාවට පමණක් සීමාවන පරිදි I ශ්‍රේණියේ නිලධරයන්ට අමතරව II ශ්‍රේණියේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් නිලධරයන්ට ද දෙපාර්තමේන්තු නිර්දේශ සහිතව මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැකි ය.

09. අයදුම්පත් එවා ඇති සියලුම නිලධරයන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති පවත්වාගෙන යනු ලබන දත්ත පද්ධතියට ඇතුළත් කරන අතර වරකට 200 කණ්ඩායම් 2 බැගින් වසරකට 800 දෙනෙකු මෙම පාඨමාලාවට සහභාගි කරවා ගනු ලබයි. පාඨමාලාව සඳහා සහභාගීවීමට තෝරාගත් අයදුම්කරුවන්ගේ නාමලේඛනයක් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ වෙබ් අඩවිය මගින් ප්‍රසිද්ධ කරනු ලබන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් තෝරා ගනු ලබන නිලධරයන් වෙත ඒ බව දන්වනු ලබයි. **එසේ දැනුම්දීමෙන් පසු සහභාගි නොවන අයදුම්කරුවන් වෙත විශ්වවිද්‍යාලය මගින් නැවත දැනුම්දීමට බැඳී නොසිටින අතර, එය නිලධරයාට හිමි වූ එක් අවස්ථාවක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ.**

*10. පාඨමාලාවේ විෂයය නිර්දේශය :*

| අනු. අංකය | විෂයය නිර්දේශය | ක්‍රෙඩිට් ගණන | කෙඩ්‍රිට් පැය |
|---|---|---|---|
| 01 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 02 | 30 |
| 02 | මානව සම්පත් කළමනාකරණය (මූලික සිද්ධාන්ත) | 02 | 30 |
| 03 | ගැටුම් කළමනාකරණය (සංවිධානයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමේදී ගැටුම් කළමනාකරණ සිද්ධාන්තවල ප්‍රායෝගික භාවිතය) | 02 | 30 |
| 04 | සංවිධාන චර්යාව | 02 | 30 |
| 05 | ව්‍යාපෘති වාර්තාව තමන්ගේ වෘත්තීය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මතු වන ගැටළුවක් හෝ වෘත්තීය ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණාත්මක නිබන්ධනයක් | 02 | 30 |
| | | **10** | **150** |

11. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2018 මාර්තු මස 14 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

(*ගැසට්* නිවේදනය හා ආදර්ශ අයදුම්පත්‍රය www.pubad.gov.lk වෙතින් බාගත කරගත හැක.)

| තැපැල් මුද්දරයක ප්‍රමාණයේ ඡායා රූපයක් මෙතැන අලවන්න. |
|---|

**ආදර්ශ අයදුම්පත්‍රය**

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන**
**තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017**
**(කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව)**

01. *(අ)* මුල’කුරු අගට යොදා මුල’කුරු සමග නම : ______ .
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
*උදා* : GUNAWARDHANA, M.G.B.S.K.

*(ආ)* සම්පූර්ණ නම : ______ .
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

*(ඇ)* මුල’කුරු සමග නම : ______ .
(සිංහලෙන් / දෙමළෙන්)

02. ඔබ අයත් වන්නේ පළාත් රාජ්‍ය සේවයට ද, එසේ නොමැති නම් කුමන රාජ්‍ය සේවයට ද යන වග අදාළ අංකය කොටුව තුළ ලියන්න. [ ]

(රජයේ සේවය - 10/ බස්නාහිර පළාත් රාජ්‍ය සේවය - 01/ මධ්‍යම පළාත් රාජ්‍ය සේවය - 02/ දකුණු පළාත් රාජ්‍ය සේවය - 03/ උතුරු පළාත් රාජ්‍ය සේවය - 04/ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවය - 05/ වයඹ පළාත් රාජ්‍ය සේවය - 06 /උතුරුමැද පළාත් රාජ්‍ය සේවය - 07/ ඌව පළාත් රාජ්‍ය සේවය - 08/ සබරගමුව පළාත් රාජ්‍ය සේවය - 09)

03. තනතුරු නාමය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ______ .

04. ඔබ අයත්වන උප දෙපාර්තමේන්තුව/ අංශය :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ______ .
(සිංහලෙන්/දෙමළෙන්) : ______ .

05. ඔබ අයත්වන දෙපාර්තමේන්තුව :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ______ .
(සිංහලෙන්/දෙමළෙන්) : ______

06. රාජකාරි ලිපිනය :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ______ .
(සිංහලෙන්/දෙමළෙන්) : ______

07. පෞද්ගලික ලිපිනය :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ______ .
(සිංහලෙන්/දෙමළෙන්) : ______ .

08. විද්‍යුත් තැපෑල : ______

09. දුරකතන අංකය :
පෞද්ගලික : [ | | | | | | | | | ]
රාජකාරි : [ | | | | | | | | | ]

10. ස්ත්‍රී/ පුරුෂ භාවය : [ ]
පුරුෂ - M
ස්ත්‍රී - F (අදළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

11. (i) ජාතික හැඳුනුම්පත් අංකය: [ | | | | | | | | | ]
(තමන් විසින් සත්‍ය පිටපතක් බවට අනු අත්සන් කළ ජාතික හැඳුනුම්පතේ පිටපතක් අමුණන්න.)

(ii) උපන් දිනය : වර්ෂය: [ | | | ] මාසය: [ | ] දිනය: [ | ]

12. *(අ.)* ඔබ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයෙකු නම් -

(i) I ශ්‍රේණියට උසස් වූ දිනය : වර්ෂය: [ | | | ] මාසය: [ | ] දිනය: [ | ]

(ii) 2018.05.04 වැනි දිනට I ශ්‍රේණියේ සක්‍රීය සේවා කාලය: අවු: [ | ] මාස: [ | ] දින: [ | ]
(තමන් විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද I ශ්‍රේණියට උසස්වීම් ලැබූ ලිපියේ පිටපත ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරන්න.)

(iii) 2013.06.01 වැනි දිනට I ශ්‍රේණියේ සේවා කාලය : අවු: [ | ] මාස: [ | ] දින: [ | ]

*(ආ.) ඔබ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II ශ්‍රේණියේ නිලධරයෙකු නම් :*

(i) II ශ්‍රේණියට උසස් වූ දිනය : වර්ෂය: [ | ] මාසය: [ | ] දිනය: [ | ]

(ii) 2018.05.04 වැනි දිනට II ශ්‍රේණියේ සක්‍රීය සේවා කාලය: අවු: ☐☐ මාස: ☐☐ දින: ☐☐

(iii) දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය: අවු: ☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

(තමන් විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිලධරයා වෙත නිකුත් කරන ලද දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ ප්‍රතිඵල ලේඛනයේ පිටපත ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරන්න.)

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, තව ද පාඨමාලාව පැවැත්වීම, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති විසින් පනවනු ලබන නීතිරීතිවලට හා ආයතන සංග්‍රහයේ නීතිරීතිවලට යටත්වන බව ද ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල වන පරිදි අයදුම්පත සකසා ඇති බවද ප්‍රකාශ කරමි.

දිනය : ____________

____________________ ,
අයදුම්කරුගේ අත්සන.

*අත්සන සහතික කිරීම*

මාගේ කාර්යාලයේ නිලධාරියකු/ නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන .................................... මහතා/මහත්මිය/මෙනවිය .................................... දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව සහතික කරමි.

____________________ ,
අත්සන සහතික කරන නිලධරයාගේ
අත්සන හා නිලමුද්‍රාව.

දිනය : __________

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

ඉහත අංක 01 සිට 12 තෙක් ඡේදවල අඩංගු තොරතුරු නිවැරදි බවත් 07 ඡේදයේ සටහනට අනුව හා 08, 09 ඡේදවල විධිවිධානවලට යටත්ව මෙම අපේක්ෂකයාට/ අපේක්ෂිකාවට මෙම පාඨමාලාවට සහභාගී වීමට සුදුසුකම් සහිත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධරයකු බවත්, නියමිත පාඨමාලා ගාස්තු ගෙවීමට දෙපාර්තමේන්තුවට හැකියාව පවතින බවත් සහතික කරමි.

____________________ ,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
නිලමුද්‍රාව.

දිනය : _________

පිරික්සුම:

1. තමන් විසින් සත්‍ය පිටපතක් බවට අනු අත්සන් කළ ජාතික හැඳුනුම්පතේ පිටපතක් අමුණා ඇත. ☐
2. මුද්දරයක ප්‍රමාණයේ ඡායා රූපයක් අයදුම්පත ඉහළ දකුණත් කෙළවරේ අලවා ඇත. ☐
3. මුද්දරයක ප්‍රමාණයේ ඡායා රූපයක් අයදුම්පත සමග අමුණා ඇත. ☐
4. තමන් විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද I ශ්‍රේණියට උසස්වීම් ලැබූ ලිපියේ පිටපත අමුණා ඇත. ☐

*හෝ*

තමන් විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිලධරයා වෙත නිකුත් කරන ලද දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ ප්‍රතිඵල ලේඛනයේ පිටපත අමුණා ඇත.

03-1341

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.